**බදුල්ල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

--------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 අප්‍රේල් 04 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර,එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 30 වන දින සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට බදුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණයගැතියෝ වූ රු.28,525 ක්, මූල්‍ය ප්‍රකාශන වල රු.28,324,373 ක් ලෙස ඇතුළත් කිරීම හේතුවෙන් ජංගම වත්කම් රු.28,295,848 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණයහිමියෝ රු.452,070 ක් කර්මාන්ත ණය ගැතියෝ ලෙස දැක්වීම හේතුවෙන් ණයගැතියෝ එම වටිනාකමින් වැඩියෙන් හා ණය හිමියෝ අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණයහිමියෝ 05 ක එකතු වටිනාකම රු.2,055,244 ක් සඳහා මූල්‍ය ප්‍රකාශන වල ප්‍රතිපාදන සලසා නොතිබීම හේතුවෙන් ජංගම බැරකම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු වෙනුවෙන් ලැබිය යුතු පොලී රු.328,236 ක් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී රු.317,200 ක් වැයකර සවිකර තිබුණු ආරක්ෂිත කැමරා පද්ධතිය ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායකවීමේ ගිණුම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) **ලැබිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.32,261,484 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ තුළ වර්ෂ 03 ක හිඟහිටි වරිපනම් රු.533,452ක්, හිඟහිටි ප්‍රාග්ධන ආධාර රු.31,262,608ක්,වර්ෂ 10 ක හිඟහිටි කඩකුලී රු.53,124 ක් ,වර්ෂ 05 ක ජල ගාස්තු රු.240,024ක්,වර්ෂ 08 ක හිඟහිටි කසළ බදු රු.168,450 ක්, හා වර්ෂයක හිඟහිටි අක්කර බදු රු.3,826 ක් අය වීමට තිබුණි.

(ආ) **ගෙවිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.9,633,003 ක් වූ ගෙවිය යුතු ශේෂය තුල වර්ෂ 02 කල්පසු වූ කර්මාන්ත ණයහිමියෝ රු.9,142,702 හා වර්ෂ 01 ක් ඉක්මවූ වියදම් ණයහිමියෝ රු.490,301 ක් විය.

1.3.3 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

සභාවට අයත් බැංකු ගිණුමක පැවති රු.5,388,614 ක ශේෂය තහවුරු කරවාගෙන නොතිබුණි.

1.3.4 **අනුකූල නොවීම්**

1.3.4.1 **නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | | **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
| --- | --- | --- | --- | --- |
| | | | රු. | |
| (අ) | (i) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය | -- | සභා සීමාව තුළ පිහිටි කාමර 20 කින් යුත් හෝටලයකින් සියයට 1% දක්වා වූ බලපත්‍ර ගාස්තුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | (ii) | 153(1) (අ), (ආ), (ඇ) වගන්ති හා 2016 දෙසැම්බර් 09 දිනැති අංක 1997 දරන ගැසට් පත්‍රය | -- | සභා බල ප්‍රදේශයේ සංවර්ධනය නොකල ඉඩම් සඳහා ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට 2 ක බද්දක් අයකිරීමට 2017 වර්ෂයේ දී අතුරු ව්‍යවස්ථා පනවා තිබුණද, සංවර්ධනය නොකළ ඉඩම් හඳුනාගෙන බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ 218 රීතිය | -- | සභාව සතු සියලුම ඉඩම් හා ගොඩනැඟිලි වාර්ෂිකව සමීක්ෂණය කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පොදු අතුරු ව්‍යවස්ථාවේ අංක 06 දරන වගන්තිය | 32,100 | 2017 වර්ෂයේ දී වාහන නවතා තැබීමේ ගාස්තු අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,988,562 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,343,789 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

-------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රුස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 2,231,760 | 2,231,760 | 3,182,785 | 889,536 | 2,111,760 | 2,111,760 | 2,014,048 | 1,465,227 |
| (ii) කුලී | 546,000 | 546,000 | 747,000 | 53,123 | 528,750 | 528,750 | 389,758 | 260,602 |
| (iii)බලපත්‍ර ගාස්තු | 284,000 | 284,000 | 525,260 | - | 270,000 | 270,000 | 272,900 | - |
| (iii)වෙනත් ආදායම | 7,502,500 | 7,502,500 | 9,662,818 | 15,923,400 | 6,003,000 | 6,003,000 | 12,146,617 | - |
| එකතුව | 10,564,260 | 10,564,260 | 14,117,863 | 16,866,059 | 8,913,510 | 8,913,510 | 14,823,322 | 1,725,829 |

2.2.2 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

2017 දෙසැම්බර් 31 දිනට මුළු බිල්කල ආදායම රුපියල් මිලියන 10.5 ක් වු අතර, වර්ෂය තුල රැස්කල ආදායම රුපියල් මිලියන 14.1 ක් විය. කෙසේ වුවත් වර්ෂය අවසන් වන විට රුපියල් මිලියන 16.9 ක ආදායමක් අයකර ගැනීමට තිබුණු අතර, ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී හිඟ ආදායම් අයකර ගැනීම සියයට 894 කින් අඩුවී තිබුණි.

2.2.3. **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් නිළධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු එකතුව රු.10,502,000 ක් විය.

3 **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්ය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වු කරුණු පහත දැක්වේ.

(අ) **ක්‍රියාකාරී සැලැස්ම**

2017 වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

සභා බල ප්‍රදේශයේ එකතුවන කැලි කසල වේවැස්ස වත්තට අයත් ඉඩම් කොටසකට බැහැර කරනු ලබන අතර, ඒ පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය විය.

(i) වර්ෂ 30 ක කාලයක සිට සභාව විසින් වේවැස්ස වත්තට අයත් බිම් කොටසකට කසළ බැහැර කලද මෙකී ඉඩම් කොටස 2017 දෙසැම්බර් 31 දින වනවිටත් සභාවට වෙත පවරාගෙන නොතිබුණි.

(ii) ඝන අපද්‍රව්‍ය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 22 (ඕ) ඡේදය ප්‍රකාරව හා 1980 අංක 47 දරන ජාතික පරිසර පනතේ විධිවිධාන අනුව කසළ බැහැර කරන ස්ථානය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) වේවැස්ස වත්තේ කසළ දමන ස්ථානයේ තිබෙන කසළ වැස්සට නිරාවරණය වීම හේතුවෙන් වැසි ජලය සමඟ මිශ්‍රවී පහලින් ගලා යන ජල පහරට එකතුවීමේ හැකියාව පැවතුණි.

(iv) දිරන කසළ ප්‍රතිචක්‍රීකරණය කර ඒවා ප්‍රයෝජනවත් කාර්යයකට යෙදවීම පිළිබඳ කසල කළමනාකරණ වැඩ පිළිවෙලක් හා සැළසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

(v) කසළ එකතු කිරීමේදී දිරන, නොදිරන හා විද්‍යුත් අපද්‍රව්‍ය ලෙස වර්ගීකරණයක් සිදු කර නොතිබුණි.

(vi) 2017 අගෝස්තු 31 දින අවසාන කසල බැහැර කරන ස්ථානයේ සිදුකරන ලද භෞතික පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

- පරිශ්‍රය තුල වලවල් දෙකක් කපා ඒවා තුලට වර්ගීකරණයකින් තොරව කසළ දමා පුළුස්සා තිබුණි.
- ක්‍රමවත් බැහැර කිරීමක් සිදු නොකරන බැවින් මැස්සන්, මදුරුවන් හා ස්ථානය අවට දැඩි දුර්ගන්ධයක් වහනය විය.

(vii) ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන යටතේ කාබණික පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් සඳහා 2016 ඔක්තෝබර් 07 දිනැතිව ව්‍යාපෘති යෝජනාවක් සභා ලේකම් විසින් ඌව පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කර තිබුණි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුව රු.7,550,000 ක් ලෙස දක්වා තිබූ අතර, 2017 වර්ෂයේ තුන්වන කාර්තුව අවසානයේ දී බිත්ති සැකසීම/ කුළුණු කණු දැමීම/ කපරාදු කිරීම දක්වා පිරිවැය 3,150,000 ක වැඩ නිමකිරීමට යෝජනා කර තිබුණි. නමුත් 2017 දෙසැම්බර් 31 දින විට ව්‍යාපෘතියේ යෝජිත කිසිදු කටයුත්තක් ඉටුකර නොතිබූ අතර, ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට සභාව අපොහොසත්වී තිබුණි.

(ඇ) **තිරසර සංවර්ධන ඉලක්ක**

-----------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2018 වනවිටත් සකස් කර නොතිබුණි.

3.2 **මානව සම්පත් කළමණාකරණය**

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 06 ක් හා අතිරික්ත 16ක් පැවතුනි.

3.3 **ප්‍රසම්පාදනය**

--------------

3.3.1 **ප්‍රසම්පාදන සැලැස්ම**

-----------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව විසින් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයෙහි ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී ආදායම් විෂයයන් 03 ක සියයට 52 සිට සියයට 65 දක්වා වූ පරාසයක විචලනයක් සහ වියදම් විෂයයන් 06 ක සියයට 22 සිට සියයට 100 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 4.2 අභ්‍යන්තර විගණනය

2017 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

ආයතනයේ මූල්‍යමය විචක්ෂණභාවය හා මූල්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා වූ විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වුවද 2017 වර්ෂය වෙනුවෙන් විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | අභ්‍යන්තර පාලනය | | නිලධාරීන් අතර වැඩ බෙදීමක් සිදුකර නොතිබීම. |
| (ආ) | ආදායම් පරිපාලනය | (i) | ආදායම් අයකර ගැනීමේ ප්‍රගතියක් නොතිබීම. |
| | | (ii) | උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීම විධිමත් පරිදි සිදුවී නොතිබීම. |
| | | (iii) | බාහිර පාර්ශවයන්ට යන්ත්‍ර කුලියට දීමේදී විධිමත් අනුමැතිය හා අධීක්ෂණය නොතිබීම. |